සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

2025-01

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

Learning Resource Center
50357
De Mazenod College
Kandana

වර්ෂ අවසාන ඇගයීම - 2024 (2025)
ஆண்டிறுதி மதிப்பீடு - 2024 (2025)
Year End Evaluation - 2024 (2025)

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 09 | විෂයය / பாடம் / Subject: ගණිතය | පත්‍රය / வினாத்தாள் / Paper: I, II | කාලය / காலம் / Time: පැය 02 යි |

නම / பெயர் / Name .................................... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ....................

# I කොටස

- 01 සිට 20 තෙක් ප්‍රශ්න සියල්ලට ම මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයකට ම ලකුණු 02 බැගින් හිමිවේ.

01. සබන් කැට තුනක මිල රු. 420 කි. සබන් කැට 5ක මිල සොයන්න.

02. සාධාරණ පදය $5(12 - n)$ වූ රටාවේ දෙවන පදය සොයන්න.

03. $x^2 + 5x - 6$ හි සාධක සොයන්න.

04. $x = \frac{3}{5}$ , $y = \frac{1}{4}$ යන්න ආදේශ කර $15x - 8y$ හි අගය සොයන්න.

05. $\frac{3a}{5a+4} - \frac{a+1}{5a+4}$ සුළු කරන්න.

06. 879.645 i. ආසන්න පළමු දශමස්ථානයට වටයන්න.

ii. ආසන්න පූර්ණ සංඛ්‍යාවට වටයන්න.

07. $\frac{a^5 \times a^{\square}}{a^3} = a^{\square} = \frac{1}{a^4}$ හිස්තැන්වලට උචිත අගයන් ලියන්න.

08. ABC ත්‍රිකෝණයේ $\hat{A} + \hat{B} = 130^0$ කි.
$\hat{A} + \hat{C} = 85^0$ කි. $\hat{A}$ හි අගය සොයන්න.




09. $1101_{දෙක} + 110_{දෙක}$ අගය සොයන්න.

10. A' කුලකයේ අවයව ලියා දක්වන්න.




11. PT - AB = AP හි P උක්ත කරන්න.

12. පතුලේ වර්ගඵලය $4500cm^2$ වූ ඝනකාභ හැඩයේ ටැංකියකට 60cm ක් ඉහළට ජලය පුරවා ඇත. එහි පිරී ඇති ජල පරිමාව ලීටර් කීයද?

13. $3 + x > 5$ යන අසමානතාව විසඳා නිඛිලමය විසඳුම් දී ඇති සංඛ්‍යා රේඛාව මත නිරූපණය කරන්න.




14. එකම වර්ගයේ පෑන් 11ක් ඇත. ඉන් 5ක් නිල් පෑන් වන අතර 2ක් කළු පෑන් වේ. අනිත් ඒවා රතු පෑන් ය. අහඹු ලෙස ගන්නා ලද පෑනක් රතු පෑනක් වීමේ සම්භාවිතාව සොයන්න.

15. 


විෂ්කම්භය 28cm වූ දී ඇති වෘත්තය පිළිබඳව පහත ප්‍රකාශවලින් නිවැරදි නම් "✓" ලකුණ ද වැරදි නම් "×" ලකුණ ද ප්‍රතිචාර කොටුව තුළ ලියන්න.

| | ප්‍රකාශය | ප්‍රතිචාරය |
|---|---|---|
| i. | වෘත්තයේ පරිධිය 176 cm කි. | |
| ii. | වෘත්තයේ වර්ගඵලය 616 $cm^2$ කි. | |

16. දී ඇති රූපයේ $A\hat{P}C = B\hat{P}D$ වේ.
$A\hat{P}B = C\hat{P}D$ බව පෙන්වන්න.




17. ABC ත්‍රිකෝණයේ BC පාදයට සමාන්තරව A හරහා PQ ඇඳ ඇත. දක්වා ඇති තොරතුරු අනුව $B\hat{A}C$ හි අගය සොයන්න.




18. i. A හි සිට B හි දිගංශය ලියන්න.

ii. B හි සිට A හි දිගංශය ලියන්න.




19. ශීතකරණයක් 10%ක වට්ටමක් ලබා දී රුපියල් 72 810 කට විකුණයි.

i. එහි ලකුණු කර තිබූ මිල කීයද ?

ii. ලබා දී ඇති වට්ටම් මුදල කීයද?

20. 17, 15, 18, $x$, 13 යන සංඛ්‍යා පනෙහි මධ්‍යයනය 16 කි.

i. $x$ හි අගය සොයන්න.

ii. ඉහත සංඛ්‍යා සමූහයේ පරාසය කීයද?

## II කොටස

- පළමු ප්‍රශ්නයට හා තවත් ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 16 ක්ද ඉතිරි ප්‍රශ්නවලට ලකුණු 11 බැගින් හිමිවේ.
- ගණිතය II පත්‍රයට පිළිතුරු වෙනත් කඩදාසිවල ලියා පළමු පත්‍රයටම අමුණන්න.

01. "බහු අස්‍රවල කෝණ" පාඩමේ දී සිදු කරන ලද ක්‍රියාකාරකමක කාර්ය පත්‍රිකාවකින් කොටසක් පහත වගුවේ දක්වා ඇත.

| බහු අස්‍රය | පාද ගණන | එක් ශීර්ෂයකට යා කළ විට සෑදෙන ත්‍රිකෝණ ගණන | බහු අස්‍රයේ අභ්‍යන්තර කෝණවල එකතුව |
|---|---|---|---|
|  චතුරස්‍රය | 4 | 2 | $2 \times 180^0 = 360^0$ |
|  පංචාස්‍රය | 5 | 3 | $3 \times 180^0 = 540^0$ |

i. ෂඩාස්‍රයක් ඇඳ ඉහත පරිදි එක් ශීර්ෂයකට අනෙක් ශීර්ෂ යා කිරීමෙන් සෑදෙන ත්‍රිකෝණ ගණන හා අභ්‍යන්තර කෝණ සියල්ලේ එකතුව ඉහත වගුවේ පරිදි ලබා ගන්න.

ii. පාද n ප්‍රමාණයක් ඇති බහුඅස්‍රයක අභ්‍යන්තර කෝණ සියල්ලේ එකතුව සඳහා ප්‍රකාශනයක් ලියන්න.

iii. සප්තාස්‍රයක අභ්‍යන්තර කෝණ සියල්ලේ එකතුව කොපමණද?

iv. සප්තාස්‍රයක අභ්‍යන්තර කෝණ 4 ක එකතුව $531^0$ කි. ඉතිරි කෝණ තුන එකිනෙකට සමානය.

එම සමාන කෝණයක අගය සොයන්න.

v. අභ්‍යන්තර කෝණ සියල්ලේ එකතුව $1620^0$ක් වූ බහුඅස්‍රයක් ඇත. එම බහුඅස්‍රයට අයත් පාද ගණන කීයද?

vi. සවිධි බහුඅස්‍රයක එක් අභ්‍යන්තර කෝණයක් $140^0$කි. එම බහුඅස්‍රයේ පාද ගණන සොයන්න.

vii. සවිධි බහුඅස්‍රයක අභ්‍යන්තර කෝණ සියල්ලේ එකතුව $2340^0$කි. එම බහුඅස්‍රයේ අභ්‍යන්තර හා බාහිර කෝණයක විශාලත්වය අතර අනුපාතය සොයන්න.